**විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (ප්‍රංශයේ රජයේ මූල්‍ය පැකේජය යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම)- 2019**

---

විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ (පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරිම) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රංශයේ නැටික්සිස් (NATIXIS) බැංකුව අතර 2012 නොවැම්බර් 05 දින එළඹි අංක බී 92 0ඒඅයි දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය මහාමාර්ග හා නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවට වානේ පාලම් 46 ක් සැපයීම ආරම්භක අවධියේ අරමුණ වූ අතර පසුව ණය මුදලේ ඉතුරුම් භාවිතයෙන් තවත් පාලම් 04 ක් එකතු කරන ලදී. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,564 කට සමාන යුරෝ මිලියන 45.80 ක් වන අතර ඉන් රු.මිලියන 3,642 කට සමාන යුරෝ මිලියන 22.05 ක් සැපයීමට ප්‍රංශයේ නැටික්සික් (NATIXIS) බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුලි මස ආරම්භ කරන ලද අතර 2015 ජුලි නිමකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු අවසන් කර නොතිබුණු අතර 2019 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කල මතය

---

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කරන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු

අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ කටයුතු 2018 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීම ණය ගිවිසුම මගින් පනවන ලද සීමාවන් සැලකීමකින් තොරව අඛණ්ඩව පැවැත්ම සංකල්පය මත සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණු අතර ව්‍යාපෘති කාර්යාලය එහි මෙහෙයුම් කටයුතු 2019 දෙසැම්බර් 31 දින දක්වා අඛණ්ඩව පවත්වා තිබුණි. | ගිණුම්කරන ප්‍රමිතීන් වැරදි ආකාරයට භාවිතා කර ඇත. | ව්‍යාපෘතියේ වත්කම් සහ වගකීම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත 2020 වර්ෂයේදී භාරදී ඇති අතර ව්‍යාපෘති පිරිවැය ප්‍රාග්ධනිත කර ඇත | ව්‍යාපෘතියේ කටයුතු අවසන් වීමෙන් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත ව්‍යාපෘතියේ වත්කම් සහ වගකීම් මාරු කල යුතු අතර ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

## 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ලැබී තිබුණු තොරතුරුවලට අනුව, පාලම් 27 ක ප්‍රතිසංස්කරණ කටයුතු රු.මිලියන 3,084.22 ක පිිරිවැයකට 2015 වර්ෂයේදී අවසන් කර තිබුණු අතර දින 29 සිට දින 455 දක්වා වූ ප්‍රමාදයන් සහිතව රු.මිලියන 3,395.57 ක පිරිවැයකට අනෙකුත් පාලම් 23 හි ප්‍රතිසංස්කරණ කටයුතු 2017 වර්ෂයේදී නිමකර තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | පාලම් 13 ක ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු.මිලියන 68.04 ක ප්‍රමාද ගාස්තු ව්‍යාපෘතිය මගින් අයකරගෙන තිබුණද ප්‍රතිසංස්කරණ කටයුතු නිමකිරීම සඳහා කාලය දීර්ඝ කිරීම්වලට ඉඩලබා දෙමින් පාලම් 10 ක ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාලව එකතුව | කොන්ත්‍රාත් පරිපාලන පිළිබඳ දුර්වල පාලනයන් වේ. | එකගවේ. | ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම් අවම කිරීම සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයක් අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 53.08 ක් 2015 සිට 2018 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැර තිබුණි. | | | |
| (ආ) | පාලං අංක 5/8 සහ පාලං අංක 12/3 හි ප්‍රතිසංස්කරන කටයුතු පිළිවෙලින් 2014 දෙසැම්බර් 16 සහ 2014 නොවැම්බර් 05 දින සැලකිය යුතු ලෙස නිම කර තිබුණු අතර ඉහත ඉදිකිරීම් කටයුතු වල වගකීම් කාලය 2015 දෙසැම්බර් 16 සහ 2015 නොවැම්බර් 05 දින අවසන් වී තිබුණි. කෙසේවෙතත්, ඉහත ඉදිකිරීම් කටයුතු වලට අදාල රදවා ගැනීමේ මුදල් රු.මිලියන 2.75ක් ව්‍යාපෘතියේ වගකීමක් ලෙස 2019 දෙසැම්බර් 31 දින වන විටත් පැවතුණි. | කොන්ත්‍රාත් පරිපාලන පිළිබද දුර්වල පාලනයක් වේ. | මාර්ග සංවර්ධන අධිකාරියේ ගම්පහ සහ කළුතර ප්‍රධාන ඉංජිනේරුවරුන්ගෙන් රු.මිලියන 1.375 ක දෙවන භාගයේ රදවා ගැනීමේ මුදල් නිකුත් කිරීම ඔවුන්ගේ ස්ථාවරය විමසා ඇති අතර පිළිතුරක් තවමත් ලැබී නොමැත. එම නිසා ඉහත වගකීම සමග මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ව්‍යාපෘතිය භාර දීමට උපදෙස් ලබාදී තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසි සමග අනුකූල වීමට පියවර ගත යුතුය. |

**3.3 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබද ගැටළු**

| විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය සදහා රජයේ ඉඩම් කොටස් 14ක් ඇතුළුව ඉඩම් කොටස් 305 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට වන්දි නිරවුල් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය විසින් ඉඩම් කොටස් 59 ක් සදහා රු.මිලියන 31.49 ක වන්දි මුදලක් සහ ඒ මත රු.මිලියන 4.43 ක පොළියක් ගෙවා තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 2013 ජුලි ආරම්භ කර තිබුණද අවුරුදු 6 1/2 ගතවී ඇතත් 2019 දෙසැම්බර් 31 දිනට සියයට 80ක් නියෝජනය කරන | ඉඩම් අත්පත් කර ගැනීම මත පොළී පිරිවැය ඉහල යාමට ඉඩ ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අයිතිය මාරු වීමට ප්‍රමාදයන් ඇති වේ. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම්වරු සහ තක්සේරු දෙපාර්තමේන්තුව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සදහා සම්බන්ධ වේ. ලැබී තිබුණු තොරතුරු අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී ප්‍රමාදවී ඇත. මේ සම්බන්ධයෙන් අදාල දිස්ත්‍රික් ලේකම්වරු වෙත සිහි කැදවීම් කිහිපයක් යවා ඇත. | ඉලක්කගත දිනයන්වලට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීම දිස්ත්‍රික් ලේකම්වරු, මිනින්දෝරු දෙපාර්තමේන්තු සහ තක්සේරු දෙපාර්තමේන්තුව අතර නිසි සම්බන්ධයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. |

ඉඩම් කැබලි 246 අත්කර ගැනීමේ කටයුතු නිම කිරීමට ව්‍යාපෘතියට නොහැකිවී තිබුණි. තවද, 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ කිසිදු ඉඩම් කොටසක් ලියාපදිංචි කර නොතිබුණු බව නිරීක්ෂණය විය.